# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1997/14 - 2016 දෙසැම්බර් මස 14 වැනි බදාදා - 2016.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම් කොටස, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගංගොඩවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි දළ සැලැස්මේ දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.560 පමණ වූ ලන්සියා දෙණිය නම් ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අන්දිරිස් මාවත, දෙවන පටුමග ; |
| *නැගෙනහිරට* | : | පුද්ගලික පාර ; |
| *දකුණට* | : | අනුෂ්කා සුභාෂිණී ගෝනගල හිමිකම් කියනු ලබන අන්දිරිස් මාවතේ වරිපනම් අංක 115/45 දරන ස්ථානය සහ අන්දිරිස් මාවත ; |
| *බටහිරට* | : | අන්දිරිස් මාවත දෙවන පටුමග. |

12 - 1118

1A - G 24723 — 17 (2016/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*